## ප්‍රතිමිලදී ගැනීමේ ප්‍රධාන ගිවිසුම

ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කළ සමාගමක් වන, (ලියාපදිංචි අංක **PB228**) අවසර ලත් ප්‍රාථමික නියෝජිතයකු වන, කොළඹ 03 ධර්මපාල මාවත අංක 53, 4 වන මහල දරන ස්ථානයේ ස්වකීය ලියාපදිංචි ලිපිනය පිහිටා ඇති HNB සෙකියුරිටීස් සමාගම (මින් මතුවට මෙහි 'නියෝජිත සමාගම' යනුවෙන් හැඳින්වෙනු ඇති අතර එමගින් එහි අනුප්‍රාප්තිකයන් සහ ලැබුම්කරුවන් ද අදහස් වේ) සහ ……………………………………..…………………………………………………………… ……………………………………..…………………………………………………………… දරන ලිපිනයේ පදිංචි ………………………… (ජා.හැ.ප. අංක-/සමාගම් ලියාපදිංචි කිරීමේ අංක ………… දරන) …………………………………………………………………… යන අය (මින් මතුවට මෙහි 'ගනුදෙනුකරු' යනුවෙන් හැඳින්වෙනු ඇති අතර, එම යෙදුම මගින් එහි අනුප්‍රාප්තිකයන් සහ ලැබුම්කරුවන් ද අදහස් වේ) (වෙන් වෙන් වශයෙන් 'පාර්ශ්වකරු' සහ එක්ව 'පාර්ශ්වකරුවන්') යන අය අතර මෙම ගිවිසුම ඇතිකරගන්නා ලද්දේ වර්ෂ ……………… දින දී ය.

1. <u>අර්ථනිරූපණ (Interpretation)</u>

මෙම ගිවිසුමෙහි කාර්යයන් සඳහා පහත අර්ථදක්වා ඇති යෙදුම්, පහත සඳහන් කර ඇති අර්ථයන් දරනු ඇතඃ

**'වේගවත් කිරීමේ දිනය' ("Acceleration Date")** යන්නෙන් අදහස් වන්නේ, මෙම ගිවිසුමෙහි නීතිරීති වලට අනුකූලව අවසන් කිරීමේ දැන්වීමක් භාරදීමෙහි ප්‍රතිඵලයක් ලෙස සියලු ගනුදෙනු ප්‍රතිමිලදී ගැනීම සිදුවනු ඇති දිනය වන, අවසන්කිරීමේ දැන්වීමක එසේ සඳහන් කර ඇති දිනයක් වේ;

**'බුන්වත්භාවී ක්‍රියාව' ("Act of Insolvency")** යන්නෙන් අදහස් වන්නේ පාර්ශ්වකරුවෙකු සම්බන්ධයෙන් (i) සාමාන්‍ය ව්‍යාපාරික කටයුතු අතර ගෙවිය යුතුව පවතින ස්වකීය ණය ගෙවීමට පාර්ශ්වකරුවා අපොහොසත් වීම (ii) පාර්ශ්වකරු එම පාර්ශ්වකරුගේ දේපල හෝ ඉන් සැලකිය යුතු කොටසක් වෙනුවෙන් භාරකරුවෙකු, අද්මිනිස්ත්‍රාසිකරුවෙකු, ලැබුම්කරුවෙකු, හෝ ඈවරකරුවෙකු හෝ ඊට සමාන නිලධාරියෙකු පත්කිරීමට උත්සාහ කරන, කැමැත්ත පළකරන හෝ එකඟ වීම (iii) ගොණුකිරීමේ දින සිට දින 30ක් ඇතුළත අත්හිටුවා හෝ නිෂ්ප්‍රභ කර නොමැති, පාර්ශ්වකරු සම්බන්ධයෙන් යම් අධිකරණයක් ඉදිරියේ හෝ යම් නියෝජිත ආයතනයක් ඉදිරියේ එම පාර්ශ්වකරුගේ බුන්වත්භාවය, ඈවර කිරීම හෝ වෙනත් වස්තුභංගත්වයක් සම්බන්ධයෙන් පෙත්සමක් හෝ ඊට සමාන නඩුකටයුත්තක් ඉදිරිපත් කිරීම හෝ ගොණු කිරීම;

**'ගිවිසුම' ("Agreement")** යන්නෙන් අදහස් වන්නේ මෙම ප්‍රධාන ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුම සහ එහි කොටසක් ලෙස පවතින සියලු ගනුදෙනු ද ඇතුළත් ව වේ;

**'සංශෝධිත ප්‍රතිමිලදී ගැනීමේ මිල' ("Amended Repurchase Price")** යන්නෙන් අදහස් වන්නේ මෙහි 7 වගන්තියෙහි ඊට ලබා දී ඇති අර්ථය වේ;

**'ව්‍යාපාරික දිනය' ("Business Day")** යන්නෙන් අදහස් වන්නේ නියෝජිත සමාගම, සාමාන්‍ය ව්‍යාපාර කටයුතු සඳහා විවෘත කර ඇති දිනයක් වේ;

**'සීඩීඑස් ගිණුම' ("CDS Account")** යන්නෙන් අදහස් වන්නේ, සුදුසුකම් ලත් සුරැකුම්පත් පවත්වාගනු ලබන හෝ, යෝග්‍ය පරිදි, පවත්වා ගැනීමට නියමිත, රජයේ සුරැකුම්පත් සඳහා (ලංකාසෙකියො) මධ්‍යම තැන්පතු පද්ධතියේ පවතින ගනුදෙනුකරුගේ ගිණුම වේ;

**'තහවුරු කිරීම' ("Confirmation")** යන්නෙන් අදහස් වන්නේ මෙහි 1 ඇමුණුමෙහි දැක්වෙන ආකෘතියට අනුකූලව නියෝජිත සමාගම විසින් නිකුත් කරනු ලබන තහවුරු කිරීම වේ;

**'පැහැර හැරීම් පිළිබඳ අනුපාතිකය' ("Default Rate")** යන්නෙන් අදහස් වන්නේ ශ්‍රී ලංකා මහබැංකුව විසින් එහි වෙබ් අඩවියෙහි පළ කර ඇති ස්ථාවර ණය පහසුකම් අනුපාතය ට වාර්ෂිකව 2%ක් එකතු කළ අගය වේ. (මෙහි පහත 9 වන වගන්තිය ප්‍රකාරව සංශෝධනය කෙරෙන පරිදි):

**'සුදුසුකම් ලත් සුරැකුම ("Eligible Security")** යන්නෙන් අදහස් වන්නේ නියෝජිත සමාගම විසින් වරින් වර ගනුදෙනුකරු වෙත දැනුම්දෙනු ලබන, ශ්‍රී ලංකා රජය විසින් හෝ ශ්‍රී ලංකා මහබැංකුව විසින් නිකුත් කළ බිල්පතක්, නෝට්ටුවක් හෝ බැඳුම්කරයක් සහ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කරන ලද ඕනෑම ආකාරයක සුරැකුමක් වන අතර, එය මෙම කරුණ සඳහා සුදුසුකම් ලත් සුරැකුමක් බවට පත් වනු ඇත;

**'සමාන තත්ත්වයේ සුරැකුම්' ("Equivalent Securities")** යන්නෙන් අදහස් වන්නේ මෙහි ඉහත 6 වගන්තිය ප්‍රකාරව මිලදී ගත් සුරැකුම්පත් විතැන් කරනු ලැබ ඇති අවස්ථාවකට අදාළව මිලදී ගත් සුරැකුම් සේ ම ඊට සමාන වර්ගයේ, නාමික වටිනාකම, විස්තරය සහ මිල දරන සුරැකුම් වේ;

**'හෙයාකට්' ("Haircut")** යන්නෙන් අදහස් වන්නේ සුදුසුකම් ලත් සුරැකුම් සම්බන්ධයෙන් (පාර්ශ්වකරුවන් අතර එකඟ වන පරිදි වෙළඳපොළ වටිනාකමට ලබාදෙන වට්ටමක් හෝ, හෝ නියෝජිත සමාගම හා ගනුදෙනුකරු අතර ගනුදෙනුවක් සම්බන්ධයෙන් නම් නියෝජිත සමාගම විසින් සද්භාවයෙන් යුතුව නියම කරනු ලබන හෙයාකට් වටිනාකමක් වේ;

'ආදායම' **("Income")** යන්නෙන් අදහස් වන්නේ මිලදීගත් සුරැකුම්පත් සම්බන්ධයෙන්, නිකුත් කරන්නා විසින් ඒ මත ගෙවනු ලබන යම් කූපනයක්, පොලියක්, ලාභාංශයක් සහ වෙනත් යම් ගෙවීමක් (මූලික මුදල සම්බන්ධයෙන් ගෙවනු ලබන යම් ගෙවීමක් හැර) වේ;

ශ්‍රීලංරු **("LKR")** යන්නෙන් අදහස් වන්නේ ශ්‍රී ලංකා රුපියල් වේ;

'වෙළඳපොළ වටිනාකම' **("Market Value")** යන්නෙන් අදහස් වන්නේ සුරැකුම්පත් සම්බන්ධයෙන් වෙළඳපොළෙහි එම සුරැකුම්පත් වල පවතින වටිනාකම හෝ එවැනි වටිනාකමක් ලබාගැනීමට නොපවතින අවස්ථාවක තහවුරු කිරීමෙහි දක්වා ඇති පරිදි යම් ක්‍රමවේදයකට අනුව තීරණය කරනු ලබන වටිනාකමක් වේ;

**'පැහැර හැරීම පිළිබඳ දැන්වීම' ("Notice of Default")** යන්නෙන් අදහස් වන්නේ, පැහැර හැරීමේ සිදුවීමක් සම්බන්ධයෙන් පැහැර හැරීමක් නොකරන පාර්ශ්වය විසින් පැහැර හැරීමක් සිදුකරන පාර්ශ්වය වෙත ලබාදෙන දැන්වීමක් වන අතර, එම දැන්වීමෙහි වේගවත් කිරීමේ දිනය සහ අවසන් කිරීමේ ගෙවීම් දිනය ද සඳහන් විය යුතුය;

**'අවසන්කිරීමේ සිදුවීම පිළිබඳ දැන්වීම' ("Notice of Termination Event")** යන්නෙන් අදහස් වන්නේ අවසන්කිරීමේ සිදුවීමක් සම්බන්ධයෙන් පැහැර හැරීමක් නොකරන පාර්ශ්වය විසින් අනෙක් පාර්ශ්වය වෙත ලබාදෙන දැන්වීමක් වන අතර, එම දැන්වීමෙහි වේගවත් කිරීමේ දිනය සහ අවසන් කිරීමේ ගෙවීම් දිනය ද සඳහන් විය යුතුය;

**'මිලදී ගැනීමේ දිනය' ("Purchase Date")** යන්නෙන් අදහස් වන්නේ අදාළ තහවුරු කිරීමෙහි එසේ සඳහන් කර ඇති දිනයයි;

**'මිලදී ගැනීමේ මිල' ("Purchase Price")** යන්නෙන් අදහස් වන්නේ අදාළ තහවුරු කිරීමෙහි එසේ සඳහන් කර ඇති මිලයි;

**'මිලදී ගත් සුරැකුම්පත්' ("Purchase Price")** යන්නෙන් අදහස් වන්නේ අදාළ තහවුරු කිරීමෙහි එසේ සඳහන් කර සුරැකුම්පත් වන අතර, මෙහි 6 වන වගන්තිය ප්‍රකාරව සුදුසුකම්ලත් විකල්ප සුරක්ෂිතයන් ද ඊට ඇතුළත් බවට සැලකෙනු ඇත;

**'ප්‍රතිමිලදී ගැනීමේ දිනය' ("Repurchase Date")** යන්නෙන් අදහස් වන්නේ අදාළ තහවුරු කිරීමෙහි එසේ දක්වා ඇති දිනයයි;

**'ප්‍රතිමිලදී ගැනීමේ මිල' ("Repurchase Price")** යන්නෙන් අදහස් වන්නේ අදාළ තහවුරු කිරීමෙහි එසේ දක්වා ඇති මිල ය;

**'ප්‍රතිමිලදී ගැනීමේ ගනුදෙනුව' ("Repurchase Transaction")** යන්නෙන් අදහස් වන්නේ, එකඟ වූ මිලකට (මිලදී ගැනීමේ මිල) එකඟ වූ දිනයක (මිලදී ගැනීමේ දිනය) සුදුසුකම් ලත් සුරැකුම්පත් (මිලදීගත් සුරැකුම්පත්) ගනුදෙනුකරු වෙත අලෙවි කිරීමට නියෝජිත සමාගම එකඟ වන සහ ඊට සමගාමීව ගනුදෙනුකරු විසින් මිලදීගත් සුරැකුම්පත් එකඟ වූ මිලකට (ප්‍රතිමිලදී ගැනීමේ මිල) එකඟ වූ දිනයක (ප්‍රතිමිලදී ගැනීමේ දිනය) මෙහි නීතිරීති වලට යටත්ව අදාළ තහවුරු කිරීමෙහි දක්වා ඇති ආකාරයට නියෝජිත සමාගම වෙත අලෙවි කිරිමට එකඟ වන ගනුදෙනුවකි;

**'නැවත ප්‍රතිමිලදී ගැනීමේ ගනුදෙනුව' ("Reverse Repurchase Transaction")** යන්නෙන් අදහස් වන්නේ, අදාළ මිලදීගැනීමේ මිලකට අදාළ මිලදී ගැනීමේ දිනයක නියෝජිත සමාගම වෙත අලෙවි කිරීමට ගනුදෙනුකරු එකඟ වන සහ ඊට සමගාමීව නියෝජිත සමාගම විසින් මිලදීගත් සුරැකුම්පත් එකඟ වූ මිලකට එකඟ වූ දිනයක මෙහි නීතිරීති වලට යටත්ව අදාළ තහවුරු කිරීමෙහි දක්වා ඇති ආකාරයට ගනුදෙනුකරු වෙත අලෙවි කිරිමට එකඟ වන ගනුදෙනුවකි;

**'අවසන් කිරීමේ දැන්වීම' ("Termination Notice")** යන්නෙන් අදහස් වන්නේ මෙහි 7(iii) වගන්තිය ප්‍රකාරව නිකුත් කරන ලද දැන්වීමකි;

**'අවසන් කිරීමේ ගෙවීම් දිනය' ("Termination Payment Date")** යනුවෙන් අදහස් වන්නේ මෙහි 7 වගන්තිය යටතේ (මෙහි නීතිරීති වලට යටත්ව) අවසන් කිරීමේ දැන්වීමෙහි දක්වා ඇති ආකාරයට අදාළ මුදල ගෙවීමට නියමිත දිනය වේ;

**'ගනුදෙනුව' ("Transaction")** යන්නෙන් අදහස් වන්නේ ප්‍රතිමිලදී ගැනීමේ ගනුදෙනුවක් හෝ නැවත ප්‍රතිමිලදී ගැනීමේ ගනුදෙනුවකි;

මීට අමතරව, මෙම ගිවිසුමෙහි සන්දර්භය මගින් වෙනත් ආකාරයකට නියම කර නොමැති නම්:

(a) කොටස් වලට සිරස්තල යොදා ඇත්තේ පරිශීලනයේ පහසුව සඳහා පමණක් වන අතර, ඒවා මෙම ගිවිසුම අර්ථනිරූපණයේ දී බල නොපානු ඇත;

(b) කොටස් පිළිබඳව සඳහන් කිරීම් මෙම ගිවිසුමෙහි කොටස් සම්බන්ධයෙන් සිදුකරන සඳහන් කිරීම් ලෙස අර්ථනිරූපණය කළ යුතුය;

(c) ඒකවචන නාමයන් අදහස් වන වචන මගින් බහුවචන ද බහුවචන මගින් ඒකවචන ද අන්තර්ගත වන අතර පුරුෂලිංග වචන වලට ස්ත්‍රීලිංග සහ නිර්ලිංගික වචන ද ඇතුළත් වේ; සහ

(d) ව්‍යවස්ථා සහ අනු-ව්‍යවස්ථා සම්බන්ධයෙන් ඇති සඳහන් කිරීම් මගින් කලින් කලට සංශෝධනය කර, නැවත පනවා හෝ විතැන් කර ඇති එම ව්‍යවස්ථා සහ අනු-ව්‍යවස්ථා සම්බන්ධයෙන් සිදුකරන ලද සඳහන් කිරීම් සේ සැලකිය යුතුය.

2. <u>ප්‍රතිමිලදී ගැනීමේ ගනුදෙනු (Repurchase Transactions)</u>

(i) පාර්ශ්වකරුවන් ගනුදෙනුවකට එළඹී ඇති විට, නියෝජිත සමාගම විසින් එක් එක් ගනුදෙනුව සම්බන්ධයෙන් වන නීතිරීති දක්වමින් තහවුරු කිරීමක් නිකුත් කරනු ඇත.

(ii) පාර්ශ්වකරුවන් අතර එළඹෙන ඕනෑම ගනුදෙනුවක් (ප්‍රකාශිතව අන් අයුරකින් එකඟ වී නොමැති නම්) මෙම ප්‍රධාන ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුමට යටත් වන අතර, එහි කොටසක් බවට පත්ව එමගින් පාලනය වනු ඇති අතර, එම එක් එක් ගනුදෙනු සඳහා වන සියලු තහවුරු කිරීම් සහ මෙම ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුම එක්ව ගත් කල තනි ගිවිසුමක් සංස්ථාපනය වනු ඇත.

(iii) මෙහි 7 කොටසට යටත් ව:

(a) එක් එක් ප්‍රතිමිලදී ගැනීමේ ගනුදෙනුව සම්බන්ධයෙන්:

(A) මිලදී ගැනීමේ දිනයේ දී මිලදී ගැනීමේ මිල ලැබීමට යටත්ව (නියෝජිත සමාගම වෙත මුදල් ගිණුමක් පවතින ගනුදෙනුකරුවෙකු සම්බන්ධයෙන් නම්, නියෝජිත සමාගම වෙත ඇති ගනුදෙනුකරුගේ මුදල් ගිණුමෙන් එම මුදල හර කරනු ඇත), නියෝජිත සමාගම විසින් අදාළ මිලදීගත් සුරැකුම්පත් ගනුදෙනුකරුගේ සීඩීඑස් ගිණුමට බැර කිරීම හෝ අදාළ මිලදීගත සුරැකුම් ගනුදෙනුකරුගේ සීඩීඑස් ගිණුමට මාරු කිරීම සිදු කරනු ඇත.

(B) ප්‍රතිමිලදී ගැනීමේ දිනයේ දී නියෝජිත සමාගම විසින් ගනුදෙනුකරුගේ සීඩීඑස් ගිණුමෙන් අදාළ මිලදී ගත් සුරැකුම්පත් හර කිරීම හෝ ගනුදෙනුකරගේ සීඩීඑස් ගිණුමෙන් අදාළ මිලදී ගත් සුරැකුම්පත් මාරුකිරීමක් හෝ ලබාගෙන, ප්‍රතිමිලදී ගැනීමේ මිල නියෝජිත සමාගම සමග පවතින ගනුදෙනුකරුගේ මුදල් ගිණුමට හෝ මෙම කාර්යය සඳහා ගනුදෙනුකරු විසින් සඳහන් කරනු ලබන වෙනත්

ගිණුමකට බැර කිරීම හෝ, ගනුදෙනුකරු සමග එකඟ වන ලද වෙනත් ආකාරයකින් ගෙවීම සිදුකරනු ඇත.

(C) ප්‍රතිමිලදී ගැනීමේ ගනුදෙනු වල දී මිලදී ගත් දිනයේ මිලදී ගත් මිලට මිලදී ගත් සුරැකුම්පත් නියෝජිත සමාගම විසින් ගනුදෙනුකරු වෙත අලෙවි කිරීමක් සිදුකරන බවට ද, නියෝජිත සමාගම විසින් ගනුදෙනුකරුගෙන් ප්‍රතිමිලදී ගත් සුරැකුම්පත් ප්‍රතිමිලදී ගැනීමේ දිනයේ ප්‍රතිමිලදී ගැනීමේ මිලට, මිල දී ගැනීමක් සිදුකරන බවටද, (සැක දුරුකිරීම සඳහා) එම මිලදී ගත් සුරැකුම්පත් සම්බන්ධ සමස්ත නෛතික සහ අර්ථලාභී බැඳියාව පිළිවෙලින් මිලදී ගත් දිනයේ දී ගනුදෙනුකරු වෙත ද ප්‍රතිමිලදී ගත් දිනයේ දී නියෝජිත සමාගම වෙත ද පවතින බවට ද මෙමගින් ප්‍රකාශිතව එකඟ වී පිළිගනිති.

(b) සෑම නැවත ප්‍රතිමිලදී ගැනීමේ ගනුදෙනුවකදී ම:

(A) මිලදී ගැනීමේ දිනයේ දී නියෝජිත සමාගම විසින් අදාළ මිලදී ගත් සුරැකුම්පත් ගනුදෙනුකරුගේ සීඩීඑස් ගිණුම හර කිරීම හෝ ගනුදෙනුකරුගේ සීඩීඑස් ගිණුමෙන් අදාළ මිලදී ගත් සුරැකුම්පත් මාරුකිරීමක් ලබාගැනීමක් සිදුකර මිලදී ගැනීමේ මිල නියෝජිත සමාගම වෙත පවතින ගනුදෙනුකරුගේ මුදල් ගිණුමට බැර කිරීම හෝ මෙම කාර්යය සඳහා ගනුදෙනුකරු විසින් සඳහන් කරනු ලබන වෙනත් ගිණුමකට බැර කිරීම හෝ, ගනුදෙනුකරු සමග එකඟ වන ලද වෙනත් ආකාරයකින් ගෙවීම සිදුකරනු ඇත.

(B) ප්‍රතිමිලදී ගැනීමේ දිනයේ දී ගනුදෙනුකරු වෙතින් ප්‍රතිමිලදී ගැනීමේ මිල ලැබීමට යටත්ව (නියෝජිත සමාගම වෙත මුදල් ගිණුමක් පවතින ගනුදෙනුකරුවෙකු සම්බන්ධයෙන් නම්, නියෝජිත සමාගම වෙත ඇති ගනුදෙනුකරුගේ මුදල් ගිණුමෙන් එම මුදල හර කරනු ඇත), නියෝජිත සමාගම විසින් අදාළ මිලදී ගත් සුරැකුම්පත් ගනුදෙනුකරුගේ සීඩීඑස් ගිණුමට බැර කිරීම හෝ අදාළ මිලදී ගත් සුරක්ෂිතයන් ගනුදෙනුකරුගේ සීඩීඑස් ගිණුමට මාරු කිරීම සිදු කරනු ඇත.

(C) නැවත ප්‍රතිමිලදී ගැනීමේ ගනුදෙනු වල දී මිලදී ගත් දිනයේ මිලදී ගත් මිලට මිලදී ගත් සුරැකුම්පත් ගනුදෙනුකරු විසින් නියෝජිත සමාගම වෙත අලෙවි කිරීමක් සිදුකරන බවට ද, ගනුදෙනුකරු විසින් නියෝජිත සමාගම වෙතින් මිලදී ගත් සුරැකුම්පත් ප්‍රතිමිලදී ගැනීමේ දිනයේ ප්‍රතිමිලදී ගැනීමේ මිලට, මිලදී ගැනීමක් සිදුකරන බවටද, (සැක දුරුකිරීම සඳහා) එම මිලදී ගත් සුරැකුම්පත් සම්බන්ධ සමස්ත නෛතික සහ අර්ථලාභී බැඳියාව පිළිවෙලින් මිලදී ගත් දිනයේ දී නියෝජිත සමාගම වෙත ද ප්‍රතිමිලදී ගත් දිනයේ දී ගනුදෙනුකරු වෙත ද පවතින බවට ද මෙමගින් ප්‍රකාශිතව එකඟ වී පිළිගනිති.

(iv) තහවුරු කිරීමෙහි වෙනත් ආකාරයකට දක්වා නොමැති නම්, ප්‍රතිමිලදී ගැනීමේ ගනුදෙනුවකදී ගනුදෙනුකරු ද නැවත ප්‍රතිමිලදී ගැනීමේ ගනුදෙනුවකදී නියෝජිත සමාගම ද, මිලදී ගැනීමේ දින සිට ප්‍රතිමිලදී ගැනීමේ දින දක්වා මිලදී ගත් සුරැකුම්පත් අලුත් කිරීමට (නැවත පිරවීමට) හෝ ඉවත් කිරීමට ඉල්ලා සිටීමට හිමිකම් නොලබති.

3. ආදායම (Income)

මිලදී ගත් සුරැකුම්පත් සම්බන්ධයෙන් නිකුත් කරන්නා විසින් යම් ආදායම් ගෙවීමක් ('ආදායම් ගෙවීම') සිදුකළහොත්:

(i) එම මුදල ප්‍රතිමිලදී ගැනීමේ ගනුදෙනුවෙහි විෂය වස්තුව වනවිට මිලදී ගැනීමේ දිනයට පසුව ඕනෑම අවස්ථාවක සහ ප්‍රතිමිලදී ගැනීමේ දිනයේ හෝ ඊට පෙර ගෙවනු ලබන්නේ නම්, එම මුදල නියෝජිත සමාගමේ වාසියට එකතු වනු ඇති අතර (සැක දුරුකිරීම සඳහා) නියෝජිත සමාගම එම මුදලට සම්පූර්ණයෙන්ම හිමිකම් කියනු ඇති අතර, එම ආදායම් ගෙවීම ගනුදෙනුකරු වෙත ගෙවනු ලැබුවහොත් ගනුදෙනුකරු විසින් එසේ ලබාගන්නා ලද මුදලට සමාන මුදලක් නියෝජිත සමාගම වෙත එය ලැබුණු ව්‍යාපාරික දිනයෙහි දී ම ගෙවිය යුතුය; සහ

(ii) නැවත ප්‍රතිමිලදී ගැනීමේ ගනුදෙනුවක් යටතේ නම්, මිලදී ගැනීමේ දිනයට පසුව ඕනෑම අවස්ථාවක සහ ප්‍රතිමිලදී ගැනීමේ දිනයේ හෝ ඊට පෙර ගෙවනු ලබන්නේ නම්, එම මුදල ගැනුම්කරුගේ වාසියට එකතු වනු ඇති අතර (සැක දුරුකිරීම සඳහා) ගැනුම්කරු එම මුදලට සම්පූර්ණයෙන්ම හිමිකම් කියනු ඇති අතර, එම ආදායම් ගෙවීම නියෝජිත සමාගම වෙත ගෙවනු ලැබුවහොත් නියෝජිත සමාගම විසින් එසේ ලබාගන්නා ලද මුදලට සමාන මුදලක් ගැනුම්කරු වෙත එය ලැබුණු ව්‍යාපාරික දිනයෙහි දී ම ගෙවිය යුතුය.

4. නිදේශනය කිරීම් (Representations)

(1) ගනුදෙනුකරු විසින් නියෝජිත සමාගම වෙත පහත පරිදි නිදේශනය කරයි (මෙම නිදේශනය කිරීම් ගනුදෙනුකරු විසින් ගනුදෙනුවකට එළඹෙන සෑම දිනක ම නැවත සිදුකරන බවට සැලකේ):

(i) මෙම ගිවිසුමට එළඹීමට සහ මේ යටතේ පවතින වගකීම් ඉටුකිරීම සඳහා සහ, මෙම ගිවිසුමෙහි හා අදාළ තහවුරු කිරීමෙහි දක්වා ඇති නීතිරීති මත මේ යටතේ ගනුදෙනු සිදුකිරීමට ගනුදෙනුකරුට සම්පූර්ණ බලය, ශක්‍යතාව සහ අධිකාරිය පවතින බවට සහ ඒ සඳහා අවශ්‍ය සෑම සහ සියලුම අවසරයන් සහ අනුමැතීන් ලබාගෙන ඇති බවට ද;

(ii) ගනුදෙනුකරු ප්‍රධානියා ලෙස මෙම ගිවිසුමට සහ ඒ යටතේ සිදුකරන ගනුදෙනු වලට එළඹෙන බවට ද;

(iii) මෙම ගිවිසුම යටතේ සිදුවන ඕනෑම ගනුදෙනුවකදී ගනුදෙනුකරු විසින් ගෙවනු ලබන සියලුම මුදල් වල තනි අර්ථලාභී හිමිකරු ගනුදෙනුකරු වන බවට ද;

(iv) ගනුදෙනුකරු සම්පූර්ණයෙන් දැනුවත් බවට ද (ගනුදෙනුකරුගේ ම තීරණය සහ තක්සේරුව මත පදනම්ව හෝ, නියෝජිත සමාගම වෙතින් ස්වාධීනව ගනුදෙනුකරු විසින් අවශ්‍ය ලබාගැනීමට යැයි සලකන පරිදි ලබාගන්නා වෘත්තීය උපදෙස් මත) ගනුදෙනු වලට එළඹීම නිසා ගනුදෙනුකරුගේ මූල්‍ය තත්ත්වයන්ට අනුව ඇතිවිය හැකි බදු සහ ගිණුම්කරණ බලපෑම් සහ ලැබිය හැකි මූල්‍ය ප්‍රතිලාභ හා අවදානම් සහ, යෝග්‍යතාව තක්සේරු කිරීම සඳහා හැකි වනු පිණිස ප්‍රමාණවත් දැනුමක් සහ අත්දැකීම් පවතින බවට ද;

(v) ගනුදෙනු සම්බන්ධයෙන් සහ මෙම ගිවිසුම සම්බන්ධයෙන් ගනුදෙනුකරු විසින් නියෝජිත සමාගමෙහි දැක්ම හෝ උපදෙස් මත විශ්වාසය නොතබන බවටද (ගනුදෙනුකරු විසින් අවශ්‍ය යැයි සලකන පරිදි ගනුදෙනුකරගේ වෘත්තීය උපදේශකයන්ගෙන් ලබාගත් උපදෙස් ද ඇතුළත්ව) ගනුදෙනුකරුගේ ම තක්සේරුව මත පදනම්ව ගනුදෙනුකරු විසින් එක් එක් ගනුදෙනුවට එළඹීමට තීරණය කර ඇති බවට ද; සහ

(vi) මේ යටතේ සිදුකරන ඕනෑම ගනුදෙනුවකට පාර්ශ්වකරුවෙකු වීමෙන් ඇතිවන බදු බලපෑම් තක්සේරු කිරීම සම්බන්ධයෙන් ගනුදෙනුකරු විසින් සෑහීමකට පත්ව ඇති බවට ද ඊට අඛණ්ඩව වගකීමට බැඳී සිටින බවට ද.

(2) නියෝජිත සමාගම විසින් පහත පරිදි ගනුදෙනුකරු වෙත නිදේශනය කර සිටියි. (මෙම නිදේශනය කිරීම් නියෝජිත සමාගම විසින් ගනුදෙනුවකට එළඹෙන සෑම දිනකම නියෝජිත සමාගම නැවත සිදුකරන බවට සැලකේ)ඃ

(i) මෙම ගිවිසුමට එළඹීමට සහ  මේ යටතේ පවතින වගකීම් ඉටුකිරීම සඳහා සහ, මෙම ගිවිසුමෙහි හා අදාළ තහවුරු කිරීමෙහි දක්වා ඇති නීතිරීති මත මේ යටතේ ගනුදෙනු සිදුකිරීමට නියෝජිත සමාගම හට සම්පූර්ණ බලය, ශක්‍යතාව සහ අධිකාරිය පවතින බවට සහ ඒ සඳහා අවශ්‍ය සෑම සහ සියලුම අවසරයන් සහ අනුමැතීන් ලබාගෙන ඇති බවට ද;

(ii) නියෝජිත සමාගම විසින් එළඹෙන ගනුදෙනු මගින් බලාත්මකව පවතින විචක්ෂණ රීති හෝ රෙගුලාසි නියෝජිත සමාගම විසින් සිදුකරන ගනුදෙනු වලට අදාළව උල්ලංඝණය නොවන බවට ද.

## 5. <u>බදු (Taxes)</u>

බදු රඳවාගැනීමට හෝ අඩුකිරීමට නීතියෙන් හෝ යම් බදු අධිකාරියක පරිචයෙන් නියම කර ඇත්නම් හැර, වෙනත් ආකාරයකට එකඟ වී නොමැති නම්, මේ යටතේ ගනුදෙනුවක් සඳහා සිදුකරන සියලුම ගෙවීම් ඕනෑම ස්වභාවයක, බදු අයකිරීමේ බලය ඇති යම් අධිකාරියක් විසින් පනවන ලද, අයකරන, එකතුකරන, රඳවාගන්නා හෝ තක්සේරු කරනු ලබන බදු සහ තීරුබදු වලින් නිදහස්ව සහ තොරව, හා රඳවාගැනීමකින් හෝ අඩුකිරීමකින් තොරව සිදුකරනු ඇත.  එවැනි තත්ත්වයකදී ගෙවන පාර්ශ්වයට

එවැනි ගෙවීමක් ගෙවීමට බැඳීමක් නොපවතින අතර, එම රඳවාගැනීමෙන් හෝ අඩුකිරීමෙන් පසුව ශුද්ධ අගය ලැබුම්කාර පාර්ශ්වය වෙත ගෙවනු ලැබේ.

6. ආදේශ කිරීම (Substitution)

(i) මිලදී ගැනීමේ දින සහ ප්‍රතිමිලදී ගැනීමේ දිනය අතර කිසියම් වේලාවක සිදුකරනු ලබන ප්‍රතිමිලදී ගැනීමේ ගනුදෙනුවකට අදාළව නියෝජිත සමාගම අදාළ යම් තහවුරු කිරීමකට අනුකූලව, මිලට ගත් සුරැකුම්පත් වෙනුවෙන් වෙනත් සුදුසුකම් ලත් සුරැකුම්පත් ආදේශකිරීම සිදුකළ හැකි අතර, කෙසේ වුවද, එසේ ආදේශ කළ සුරැකුම්පත් වල වෙළඳපොළ වටිනාකම එසේ ආදේශ කරනු ලබන දිනයේ දී අවම වශයෙන් එමගින් මුලින්ම ආදේශ කරනු ලබන එසේ මිලට ගත් සුරැකුම්පත් වල වෙළඳපොළ වටිනාකමට සමාන විය යුතුය. එසේ ආදේශ කිරීම සුදුසුකම් ලත් වෙනත් සුරැකුම්පත් ගනුදෙනුකරු වෙත මාරුකිරීම මගින් සහ ඊට සමගාමීව අදේශකරනු ලබන මිලට ගත් සුරැකුම්පත් සම්බන්ධයෙන් නියෝජිත සමාගම වෙත අදාළ සුරැකුම්පත් වල වටිනාකමට සමාන මුදලක් මාරුකිරීම මගින් සිදුකෙරෙනු ඇත. ආදේශ කිරීමෙන් පසුව ආදේශ කළ සුරැකුම්පත් මිලටගත් සුරැකුම්පත් ලෙස සැලකෙනු ඇති අතර, එසේ ආදේශ කරනු ලැබූ මුලින් මිලදීගත් සුරැකුම්පත් තවදුරටත් මිලදීගත් සුරැකුම්පත් ලෙස නොසැලකෙනු ඇත. ඒ අනුව, මාරුකිරීමක් ලබාගැනීමට හෝ ගනුදෙනුකරුගේ සීඩීඑස් ගිණුමට මාරුකිරීමක් සිදුකිරීමට හෝ ගනුදෙනුකරුගේ සීඩීඑස් ගිණුම හර කිරීමට සහ බැර කිරීමට නියෝජිත සමාගම හිමිකම් ලබනු ඇත.

(ii) නැවත ප්‍රතිමිලදී ගැනීමේ ගනුදෙනුවක් සම්බන්ධයෙන් නම් ඉහත (i) හි ආදේශ කිරීම පිළිබඳ ප්‍රතිපාදන එවැනි ආදේශ කිරීමක් සඳහා සපයනු ලබන තහවුරු කිරීමකට පමණක් අදාළ වනු ඇත.

7. පැහැරහැරීමේ සිදුවීම/ අවසන් කිරීමේ සිදුවීම (Event of Default/Termination Event)

(i) මෙම ගිවිසුම යටතේ පහත දැක්වෙන අවස්ථා පැහැර හැරීමේ අවස්ථාවන් ලෙස සැලකෙනු ඇත:

(a) යම් පාර්ශ්වයක් මේ යටතේ පවතින ගෙවීම් සිදුකිරීමට හෝ බැඳීම් ඉටුකිරීමට අපොහොසත් වීම;

(b) මේ යටතේ පාර්ශ්වයක් විසින් සිදුකරන ලද නිදේශනයන් කිසිවක් හරයාත්මක ලෙස අසත්‍ය හෝ නොමග යවනසුලු වීම;

(c) යම් පාර්ශ්වයක් සම්බන්ධයෙන් බුන්වත් භාවයට පත්වන ක්‍රියාවක්;

(d) ගනුදෙනුකරු තනි පුද්ගලයෙකු වන අවස්ථාවක, ඔහු මියගියහොත් හෝ සිහිවිකල් භාවයට පත් වුවහොත් හෝ වෙනත් ආකාරයකින් අශක්‍යතාවකට පත් වුවහොත හෝ, සහ ගනුදෙනුකරුගේ මරණය සිදුවූ අවස්ථාවක නියෝජිත සමාගම වෙත ගෙවිය යුතු හිඟව පවතින මූල්‍ය වගකීම් ඔහුගේ මරණයෙන් දින 30ක කාලයක් තුළ ගෙවනු නොලැබුවහොත්.

(ii) පැහැර හරින පාර්ශ්වයට දැනගැනීමට ලැබුණු පැහැර හරින පාර්ශ්වයේ පැහැර හැරීමේ සිදුවීමක් සම්බන්ධයෙන් පැහැර හරින පාර්ශ්වය විසින් පැහැර නොහරින පාර්ශ්වය වෙත දැනුම් දීමට වගකීමක් පවතී;

(iii) යම් අවස්ථාවක පැහැර හැරීමක් සිදුවුවහොත් පැහැර නොහරින පාර්ශ්වය විසින් එසේ පැහැර හරින පාර්ශ්වය වෙත දින තුනකට (3) නොඅඩු දැන්වීමක් ලබාදෙමින් අවසන් කිරීමේ දැන්වීමක් යවනු ඇත;

(iv) පැහැර නොහරින පාර්ශ්වය අවසන් කිරීමේ දැන්වීමක් ලබා දී ඇති විට, එක් එක් ගනුදෙනුව සම්බන්ධයෙන් මේ යටතේ ප්‍රතිමිලදී ගැනීමේ දිනය වේගවත් කිරීමේ දිනය දක්වා වේගවත් කෙරෙනු ඇත (එම දිනය මෙහි නීතිරීති වලට අනුව අවසන් කිරීමේ දැන්වී ලැබිය යුතු වන දිනයට වඩා කලින් දිනයක් වනු ඇත). ප්‍රතිමිලදී ගැනීමේ මිල එක් එක් ගනුදෙනුවට අදාළව ඊට අනුව, එක් එක් ගනුදෙනුව සම්බන්ධයෙන් අදාළ ප්‍රතිමිලදී ගැනීමේ දිනය වේගවත් කිරීම සලකා බලා, නියෝජිත සමාගම විසින් සද්භාවයෙන් තීරණය කරනු ලබන මුදලක් දක්වා සංශෝධනය කෙරෙනු ඇත (එසේ සංශෝධිත ප්‍රතිමිලදී ගැනීමේ මිල 'සංශෝධිත ප්‍රතිමිලදී ගැනීමේ මිල');

(v) එසේ වේගවත් කිරීමේ දිනයක් පවතින විට (A) නියෝජිත සමාගම විසින් (a) මේ යටතේ මිලදී ගත් සුරැකුම්පත් වල වෙළඳපොළ වටිනාකම තීරණය කරනු ඇත සහ (b) මේ යටතේ සංශෝධිත ප්‍රතිමිලදී ගැනීමේ මිල තීරණය කරනු ඇත සහ (B) ගනුදෙනුව යටතේ පාර්ශ්වකරුවන්ගේ වගකීම් ස්වයංක්‍රියව විතැන් වනු ඇත:

   (1) (a) සියලුම ප්‍රතිමිලදී ගැනීමේ ගනුදෙනු යටතේ ඇති වෙළඳපොළ වටිනාකම් වල සමස්තය (b) සියලුම නැවත ප්‍රතිමිලදී ගැනීමේ ගනුදෙනු යටතේ සංශෝධිත ප්‍රතිමිලදී ගැනීමේ මිලගණන් වල සමස්තය යන ඒවායේ එකතුව (නියෝජිත සමාගම් මුදල්) (c) සියලුම නැවත ප්‍රතිමිලදී ගැනීමේ ගනුදෙනු යටතේ ඇති වෙළඳපොළ වටිනාකම් වල සමස්තය (d) සියලුම ප්‍රතිමිලදී ගැනීමේ ගනුදෙනු යටතේ සංශෝධිත ප්‍රතිමිලදී ගැනීමේ මිලගණන් වල සමස්තය යන ඒවායේ එකතුව (ගනුදෙනුකාර මුදල්) ඉක්මවා යන්නේ නම්, ගනුදෙනුකරුගේ පාර්ශ්වයේ වගකීමක් ලෙස (මෙහි 7(vi) වගන්තියට යටත්ව) අවසන්කිරීමේ ගෙවීම් දිනයේ දී එම අතිරික්ත මුදල ට සමාන මුදලක් නියෝජිත සමාගම වෙත ගෙවිය යුතුය; සහ

   (2) ගනුදෙනුකාර මුදල් ප්‍රමාණය (මෙහි 7(v)(B)(1) වගන්තියෙහි දක්වා ඇති ආකාරයට) නියෝජිත සමාගමෙහි මුදල් ප්‍රමාණය (මෙහි 7(v)(B)(1) වගන්තියෙහි දක්වා ඇති ආකාරයට) ඉක්මවා යන්නේ නම්, නියෝජිත සමාගම පාර්ශ්වයෙන් වගකීමක් ලෙස (මෙහි 7(vi) වගන්තියට යටත්ව) අවසන්කිරීමේ ගෙවීම් දිනයේ දී එම අතිරික්ත මුදල ට සමාන මුදලක් ගනුදෙනුකරු වෙත ගෙවිය යුතුය.

(vi) යම් මුදලක් මෙම ගිවිසුම යටතේ හෝ අන් ආකාරයකින් පැන නැගුණ ද, නියෝජිත සමාගම වෙත පවතින ගිණුම් ඒකාබද්ධ කිරීමේ, එකට ගෙතීමේ හෝ පියවීමේ අයිතීන් සීමාකිරීමකින් තොරව නියෝජිත සමාගම විසින් (a) මෙහි 7(v)(B)(1) වගන්තිය යටතේ තමා වෙත ගෙවිය යුතුව ඇති යම් මුදලක් තමා විසින් ගනුදෙනුකරුට ගෙවිය යුතුව පවතින කිසියම් මුදලකට එරෙහිව පියවනු ලැබිය හැකි අතර, (b) තමා විසින් (මෙහි 7(v)(B)(2) වගන්තිය යටතේ ගෙවිය යුතුව ඇති යම් මුදලක් තමා වෙත ගනුදෙනුකරු විසින් ගෙවිය යුතුව පවතින වෙනත් යම් මුදලකකට එරෙහිව පියවනු ලැබිය හැකිය.

## 8. දැන්වීම් (Notices)

ගනුදෙනුකරුට ඉහතින් දක්වා ඇති ලිපිනය වෙත හෝ ගනුදෙනුකරු විසින් නියෝජිත සමාගම වෙත ලිඛිතව දන්වා ඇති වෙනත් යම් ලිපිනයක් වෙත හෝ දැන්වීම් ලබාදෙනු ඇති අතර, ඒවා (i) ව්‍යාපාරික දිනයක නියෝජිත සමාගමෙහි ව්‍යාපාරික වේලාවන් (ව්‍යාපාරික වේලාවන්) තුළ පුද්ගලිකව භාර දී ඇති විට, එම ව්‍යාපාරික දිනයේ දී ගනුදෙනුකරු වෙත ලැබී ඇතැයි සැලකෙනු ඇති අතර, භාරදීමේ වේලාව ව්‍යාපාරික වේලාවෙන් පිටත වන අවස්ථාවක ඊළඟ ව්‍යාපාරික දිනයේ ව්‍යාපාර ආරම්භ වන වේලාවේ දී භාර දී ඇතැයි සැලකෙනු ඇති අතර, (ii) ෆැක්ස් මගින් භාර දී ඇති අවස්ථාවක අදාළ යැවීම පිළිබඳ තහවුරු කිරීම ලැබුණු ව්‍යාපාරික දිනයේ දී (හෝ ව්‍යාපාරික දිනයක් නොවන දිනයක දී ෆැක්ස් මගින් භාර දී ඇති අවස්ථාවක හෝ භාරදීමේ වේලාව ව්‍යාපාරික වේලාවෙන් පිටත වන අවස්ථාවක ඊළඟ ව්‍යාපාරික දිනයේ ව්‍යාපාර කටයුතු ආරම්භ කරන වේලාවේ දී භාර දී ඇතැයි සැලකෙනු ඇත) සහ (iii) තැපෑලෙන් භාර දී ඇති අවස්ථාවක තැපැල් කිරීමෙන් පසු ව්‍යාපාරික දින දෙකකින් භාර දී ඇතැයි සැලකෙනු ඇත.

## 9. ප්‍රමාද වූ ගෙවීම් මත පොලිය (Interest on late payments)

කිසියම් ගනුදෙනුවක් යටතේ හෝ මෙම ගිවිසුම යටතේ කළ යුතු යම් ගෙවීමක් සිදුකිරීමට පාර්ශ්වකරු අපොහොසත් වන අවස්ථාවක, එම පාර්ශ්වය එසේ ගෙවිය යුතු නමුත් නොගෙවා ඇති මුදල මත ගෙවීම නියමිත දින සිට එම ගෙවීම සත්‍ය වශයෙන්ම අනෙක් පාර්ශ්වයට ලැබුණු දිනය දක්වා, නමුත් එසේ ලැබුණු දිනය අතහැර, පැහැර හැරීම පිළිබඳ අනුපාතයට පාර්ශ්වකරු විසින් පොලී ගෙවිය යුතුය. එම පොලිය දෛනික සමස්ත මුදල මත සහ සැබෑ ලෙස ම ප්‍රමාද වූ දින ගණන මත ගණනය කෙරෙනු ඇත.

10. <u>මාරු කිරීමට නොහැකි බව (Non-Transferability)</u>

(i) අනෙක් පාර්ශ්වයේ පූර්ව ලිඛිත අනුමැතිය ලබාගැනීමකින් තොරව, කිසිදු පාර්ශ්වයක් විසින් මෙම ගිවිසුම යටතේ පවතින ස්වකීය අයිතීන් සහ වගකීම් මාරු කිරීමට හෝ පැවරීමට නොහැකි අතර, ඒ සම්බන්ධයෙන් තෙවන පාර්ශ්වයක අයිතීන් නිර්මාණය කිරීමට ද නොහැක.

(ii) අදාළ තහවුරු කිරීමේ වෙනත් ආකාරයකට සඳහන් කර ඇත්නම් මිස, මිලදී ගත් සුරැකුම්පත් මිලට ගත් දින සිට ප්‍රතිමිලදී ගැනීමේ දිනය දක්වා කිසිදු අවස්ථාවක ප්‍රතිමිලදී ගැනීමේ ගනුදෙනුවක් මත අලෙවි කිරීමට නොහැක.

11. <u>නියෝජිත සමාගමෙහි වගකීම්/ පාලනයෙන් බැහැර සිදුවීම් (Obligations of DEALER/Force Majeure)</u>

(i) මේ යටතේ නියෝජිත සමාගම හට පවතින වගකීම් නියෝජිත සමාගම විසින් පමණක් ඉටු කරනු ලබන අතර, එසේ සිදුකිරීම ශ්‍රී ලංකාවේ අදාළ සියලු නීතිරීති හා රෙගුලාසි වලට යටත් වේ.

(ii) පාලනයෙන් බැහැර සිදුවීමක් හෝ රජයේ ක්‍රියාවක් හේතුවෙන් නියෝජිත සමාගම හට එසේ සිදුකිරීමට නොහැකි හෝ ප්‍රායෝගිකව නොහැකි වන අවස්ථාවක, නියෝජිත සමාගමට එම වගකීම් ඉටුකිරීමට නොහැකි හෝ ප්‍රායෝගිකව නොහැකි තත්ත්වය අවසන් වන තෙක් එම වගකීම් අත්හිටුවනු ඇති අතර, එම අත්හිටවූ කාලසීමාව තුළ අත්හිටවූ වගකීම් සම්බන්ධයෙන් පොලී හෝ වෙනත් ගෙවීම් (එවැනි අත්හිටුවීමක් නොපවතින වගකීම් සම්බන්ධයෙන් ගෙවිය යුතු වන පොලී හෝ වෙනත් ගෙවීම් හැර) ගෙවිය යුතු නොවේ. කෙසේ වුවද, එක් එක් පාර්ශ්වය සම්බන්ධයෙන් පැහැර හැරීමේ අවස්ථාවකදී හෝ අවසන් කිරීමේ සිදුවීමකදී එම තත්ත්වයන් මත ශුද්ධ අගය හෝ පියවීමක් සිදුකිරීමේදී එම වගකීමෙහි වටිනාකම ඇතුළත් කිරීමට නියෝජිත සමාගමට හැකි වන පරිදි, අදාළ වගකීම් ඉටුකළ යුතුව පවතින බවට නියෝජිත සමාගම විසින් ප්‍රකාශ කරනු ඇත.

12. <u>පාලනය වන නීතිය/ අධිකරණ බලයට යටත් වීම (Governing Law/Submission to Jurisdiction)</u>

මෙම ගිවිසුම සහ මේ යටතේ ඇතුළත් වන සියලුම ගනුදෙනු ශ්‍රී ලංකාවේ නීතිරීති මගින් පාලනය වන අතර පාර්ශ්වකරුවෝ ශ්‍රී ලංකාවේ විශේෂ අධිකරණ බලයට යටත් වෙති.

ඊට සාක්ෂි පිණිස, පාර්ශ්වකරුවන් විසින් මෙහි පහත සඳහන් කර ඇති දිනයන් හි දී මෙම ලේඛනයේ පළමු පිටුවෙහි දක්වා ඇති දින සිට බලාත්මක වන පරිදි මෙම ලේඛනයට අත්සන් තබන ලදී:

විසින්: ..................................................................

| | |
|---|---|
| විසින්: .............................................................. | විසින්: .............................................................. |
| නම: | නම: |
| පදවි නාමය: | පදවි නාමය: |
| දිනය: | දිනය: |

ගනුදෙනුකරු තනි පුද්ගලයෙකු වන අවස්ථාවක

| | |
|---|---|
| අත්සන (අත්සන්):……………………… | අත්සන (අත්සන්): ……………………….……… |
| නම: | නම: |
| අත්සන (අත්සන්):……………………… | අත්සන (අත්සන්): ……………………….……… |
| නම: | නම: |
| සාක්ෂි: ……………………………….. | (නම) ……………………………….. |
| සාක්ෂි: ……………………………….. | (නම) ……………………………….. |

දිනය:

[ගනුදෙනුකරු සංස්ථාපිත ආයතනයක් වන අවස්ථාවක]

කොළඹ දී සීමාසහිත ……………………. සමාගමේ පොදු මුද්‍රාව තබන ලද්දේ සහ අධ්‍යක්ෂ වරුන් විසින් අත්සන් තබන ලද්දේ අධ්‍යක්ෂ ……………………. සහ අධ්‍යක්ෂ ……………………. ඉදිරිපිට දී

සාක්ෂිකරුවන්

(1) …………………………………..

(2) …………………………………..

(සමාගමේ බලයලත් අත්සන්කරු) විසින් අත්සන් තබන ලද්දේ කොළඹ දී ය

අත්සන

සාක්ෂිකරුවන්

(1) …………………………………..

(2) …………………………………..

ඇමුණුම 1

<u>නියෝජිත සමාගමේ ලිපිශීර්ෂය</u>

ණය දෙන තැනැත්තාඃ (ගනුදෙනුකරුගේ නම)

ණයගැතියාඃ (නියෝජිත සමාගමේ නම)

දිනය

විෂයයඃ ගනුදෙනුව (යොමු අංකයඃ [ ])

මහත්වරුනි,

මෙම ලිපියෙහි අරමුණ වන්නේ (අප අතර පවතින ප්‍රධාන ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුමෙහි කාර්යයන් සඳහා 'තහවුරු කිරීමක්' වන) මෙහි පහත දක්වා ඇති ගිවිසුම් දිනයෙහි දී අප අතර එළඹි ප්‍රතිමිලදී ගැනීමේ ගනුදෙනුවෙහි නීතිරීති සහ කොන්දේසි දැක්වීමයි.

මෙම තහවුරු කිරීම, ගිවිසුමෙහි අතිරේකයක් වනු ඇති අතර, එහි කොටසක් බවට පත් ව ඊට යටත් වනු ඇත. පහතින් ප්‍රකාශිතව සංශෝධනය කර ඇති ආකාරයට හැර ගිවිසුමෙහි අන්තර්ගත සියලුම ප්‍රතිපාදන මගින් මෙම තහවුරු කිරීම පාලනය වන අතර, ගිවිසුමෙහි අර්ථදක්වා ඇති සහ මෙම තහවුරු කිරීමේ භාවිත කර ඇති වචන සහ යෙදුම් වලට ගිවිසුමෙහි පවතින ඇති අර්ථයන් ම පවතිනු ඇත.

මෙම තහවුරු කිරීමෙහි දක්වා ඇති ගනුදෙනු ලංකාසෙකියො හි මධ්‍යම තැන්පතු පද්ධතියෙහි වාර්තාගත කෙරෙනු ඇත.

1. ගිවිසුම්ගත දිනයඃ
2. ගනුදෙනු වල ස්වභාවයඃ (ප්‍රතිමිලදී ගැනීමේ ගනුදෙනු) (නැවත ප්‍රතිමිලදී ගැනීමේ ගනුදෙනු)
3. මිලදී ගත් සුරැකුම්ඃ
   (විස්තර + *ISIN* ආදී අංක)
4. මිලදී ගත් සුරැකුම් වල වෙළඳපොළ වටිනාකම්ඃ
5. මිලදී ගත් දිනය/වටිනාකම් දිනයඃ
6. මිලදී ගැනීමේ මිල / පොලී අනුපාතිකයඃ
7. ප්‍රතිමිලදී ගැනීමේ මිල / කල්පිරෙන දිනයඃ
8. ප්‍රතිමිලදී ගැනීමේ මිල / පොලී අනුපාතිකයඃ
9. සුරැකුම්පත් විතැන් කිරීමට අවසර ඇත (ඔව්/නැත)ඃ

10. සුරැකුම්පත් අලුත් කිරීමට අවසර ඇත (ඔව්/නැත):

11. සුරැකුම්පත් ඉවත් කිරීමට අවසර ඇත (ඔව්/නැත):

12. සුරැකුම්පත් විකිණීමේ හැකියාවට අවසර ඇත (ඔව්/නැත): N

13. අතිරේක නීතිරීති

    i. යම් සුරැකුම්පතක වෙළඳපොළ වටිනාකම තීරණය කළ යුතු වන අවස්ථාවක එය පාර්ශ්වයන් අතර අන්‍යෝන්‍ය වශයෙන් එකඟ වූ අනුපාතයන්ට අනුව සිදුකෙරෙනු ඇති අතර ඊට අපොහොසත් වුවහොත් අදාළ සුරැකුම්පත් සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පළ කර ඇති අනුපාතයන්ට අනුව සිදුකෙරෙනු ඇත.

    ii. කල්පිරීමේ ආදායම/පොලිය, අයදුම්පතෙහි සඳහන් කර ඇති ඔබගේ මුදල් ගිණුමට හෝ ලිඛිතව අප වෙත දැනුම් දී ඇති වෙනත් ගිණුමකට හෝ බැර කෙරෙනු ඇත

14. තහවුරු කිරීමෙහි පවතින වැරදි: මෙම තහවුරු කිරීම් වල පවතින යම් වරදක් ඇතොත්, ඒ බව මෙම තහවුරු කිරීම ලැබුණු පසු දින 2ක් තුළ ඔබ විසින් අප වෙත ලිඛිතව දැනුම් දිය යුතු වේ.

අපගේ ෆැක්ස් අංකය                    අපගේ ටෙලෙක්ස් අංකය

ලේඛන සම්බන්ධ විමසීම් සඳහා අපගේ දුරකථන අංකය:

ස්තුතියි

_________________________

(නියෝජිත සමාගමේ නම)

වෙනුවට